# ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ කාන්තා ව්‍යවසායකයන්ගේ භූමිකාව දෙස හැරී බලමු

ඈත අතීතයේ කුවේණියගේ පටන් අද වර්තමානය දක්වා ශ්‍රී ලංකා ආර්ථික පද්ධතියට කාන්තාවන්ගේ දායකත්වය නන් අයුරින් ලැබී ඇති බව කාටත් නොරහසකි.

සංඛ්‍යා ලේඛන දත්තවලට අනුව කෝටි දෙකකට ආසන්න ශ්‍රී ලාංකේය මුළු ජනගහනයෙන් හරි අඩකටත් වඩා කාන්තා ජනගහනයක් දැකිය හැකිය.

ශ්‍රී ලංකාව වැනි පීතෘ මූලික පුරුෂාධිපත්‍ය රජ කරන සමාජ ක්‍රමයක් තුළ එකී බහුතර කාන්තා ජනගහනය මුහුණදී ඇති කටුක යථාර්ථය වනුයේ සිය පවුල ඇති දැඩි කරමින් සාම්ප්‍රදායික ගෘහණියක ලෙස දිවි ගෙවීමයි.

ආර්ථික සංවර්ධනයක් කරා සැවොම සිහින මවන මොහොතක එකී සිහින බොඳ වී යෑමට ඉඩ නොදී යථාර්ථයක් බවට පත්කර ගැනීමට අප ඉදිරියේ පවතින තවත් ඵලදායී උපාය මාර්ගයක් ලෙස කාන්තා ව්‍යවසායකයන් සවිබල ගැන්වීම හඳුනාගත හැක.

ශ්‍රී ලංකා ආර්ථික පද්ධතියට කාන්තා ව්‍යවසායකයන්ගේ අවශ්‍යතාව ඉතා තදින් දැනීමට බලපාන ප්‍රධාන හේතු සාධක කිහිපයකි. ප්‍රධාන වශයෙන්ම ස්ත්‍රී පාර්ශ්වය ව්‍යාපාරික කටයුතුවල නිරත වීම නිෂ්පාදන අංශයේ හෝ වේවා, සේවා අංශයේ හෝ වේවා එය දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක වන්නකි.

භාණ්ඩ හා සේවා වෙළෙඳ පොළ තුළ සුලභ වීම එම රටේ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමට, අවසාන වශයෙන් ආර්ථික සංවර්ධනයක් කරා පෙරමං තැනීමකි. තවත් පැතිකඩක් බලන විට එය රටේ සේවා වියුක්තියට සපයන කාලීන විසඳුමකි.

ව්‍යවසායිකාව සමාජයට ජනිත කරනා නව රැකියා ප්‍රමාණය වැඩිවත්ම රටේ සේවා නියුක්තිය ප්‍රතිශතාත්මකව සැලකිය යුතු මට්ටමකින් ඉහළ යයි. එමෙන්ම දේශීය වශයෙන් ඌන උපයෝජනය වී ඇති සම්පත් ඵලදායී ලෙස පරිභෝජනය කිරීමටද මින් අවස්ථාව සැලසෙනු ඇත.

මෙහිදී විශේෂයෙන්ම සැලකිල්ලට ගතයුතු කරුණ වන්නේ ආර්ථික සංවර්ධනය මැනීමට ජාතික ගිණුම් සකස් කිරීමේදී ගෘහණියගේ දායකත්වය සැලකිල්ලට නොගැනීමයි. මෙයට ඵලදායී ආදේශකයක් ලෙස ඉදිරිපත් කළ හැක්කේ කාන්තාව තවදුරටත් මුළුගැන්වී නොසිට, සාම්ප්‍රදායික ගෘහණියගේ රාමුවෙන් පිටතට පැමිණ ව්‍යවසායිකාවක් ලෙසට ඇගේ දායකත්වය සැපයීමයි.

මෙහිදී අවබෝධ කරගත යුතු තවත් එක් ප්‍රධාන කරුණක් වනුයේ කාන්තා ශ්‍රම දායකත්වය පිළිබඳ ගොඩනැගී ඇති මතවාදද කාන්තා ව්‍යවසායකත්වය හා බැඳී පැවතීමයි. මහබැංකු වාර්තාවන්ට අනුව රාජ්‍ය ආදායමට වැඩිම ප්‍රතිශතයකින් දායකවන්නේ ලක්ෂ 15 ඉක්ම වූ විදේශයන්හි ශ්‍රමය සපයන කාන්තාවන්ය.

දහදිය කඳුළු මැද දුරු රට සිට දිය කරන කාන්තා ශ්‍රමය වෙනුවෙන් නිසි වැටුපක් ඔවුන්ට ලැබෙනවාද යන්න අදටත් ප්‍රශ්නාර්ථයකි.

එමෙන්ම ලක්ෂ 10 ඉක්ම වූ මෙරට ඇඟලුම් කර්මාන්තයේ නියැළෙන වෙළෙඳ කලාප යුවතියන්ගේ, තේ දළු නෙළන ළඳුන්ගේ වැඩකරන ශ්‍රමය පිළිබඳව ඇත්තේද අතිශය ශෝචනීය තත්ත්වයකි.

අඩු පඩියට වැය සූරා කෑමට ලක්වන ඔවුන්ගේ ශ්‍රමය ව්‍යවසායකත්වය කෙරෙහි යොමු කළා නම් කොතරම් වටිනාකමක් ලැබේද? එය සැමගේ අවධානයට ලක්විය යුතු කාලීන මාතෘකාවකි.

ඛේදනීයම තත්ත්වය වනුයේ වර්තමානය වනවිට රැකියා විරහිත තරුණියන්ගෙන් අතිබහුතරයක් උගත් පිරිසක් වීමයි. උසස් අධ්‍යාපනය හමාර කර රැකියාවක් බලාපොරොත්තුවෙන් දෑස් දල්වා නිවසට දිය කරන තාරුණ්‍යය හමුවේ ඔවුහු දිනෙන් දින ඉච්ඡා භංගත්වයට පත්වෙති.

මෙවැනි තත්ත්වයක් හමුවේ ව්‍යවසාය සංස්කෘතියක් ඔවුන්ට හඳුන්වාදීමෙන් නව පුනර්ජීවයක් ඇති කළ හැකිය. වර්තමානය වන විට එය ආර්ථික පමණක් නොව සමාජීය අවශ්‍යතාවක් බවට පත්ව ඇත්තේද ඒ නිසාමය.

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කාන්තා ව්‍යවසායකයාගේ ප්‍රගමණයට හේතු වුණු කරුණු බොහෝ ලෙස අධ්‍යයනය කළ හැක. බොහෝ ව්‍යාපාර හිමි කාන්තාවන් දෙස බැලීමේදී ඔවුන්ගේ සාර්ථකත්වයට හේත වූ ප්‍රධාන කරුණු ලෙස සේවා ව්‍යාපාරයට ආරම්භ කිරීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය හා ආයෝජනය ඉතා පහළ මට්ටමක තිබීම, යටිතල පහසුකම්වල පිරිවැය අවම මට්ටමක තිබීම, ක්ෂුද්‍ර ණය (Micro Credit) ලබාගැනීමේ පහසුකම්, තාක්ෂණික පුහුණු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීම, ස්වභාවයෙන් කාන්තාව වූ කලී තීරණ ගැනීමේදී හා අනෙක් වැඩකටයුතුවලදී වංචා දූෂණයෙන් මිදුණු විශ්වාස කළ හැකි ස්ත්‍රී ගතිපැවතුම්වලින් යුතු වීම, කාන්තා ව්‍යවසායකයන්ට සිටින කාන්තා ව්‍යවසායක තරගකරුවන් ප්‍රමාණය අවම මට්ටමක පැවතීම, ව්‍යාපාර නොමැති වූවද ඇය සඳහා රැකවරණය සලසන පාර්ශ්වයන් සිටීම ආදිය දැක්විය හැකිය.

මෙකී සඳහන් කළ සාධක යොදාගෙන පවුල් සංස්ථාවට පමණක් සීමා වී තිබූ ශ්‍රී ලාංකික කාන්තාවගේ ව්‍යවසායක කුසලතා දේශීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ මාහැඟි අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා යොමු කරවාගත හැක.

අනෙක් පැතිකඩය ඔස්සේ බැලුවහොත් වර්තමානය ගත්කළ ශ්‍රී ලාංකීය කාන්තා ව්‍යවසායකයන්ගේ නව පිබිදීමට ප්‍රධාන වශයෙන් බාධා එල්ල කරන ආර්ථික සමාජයීය හා සංස්කෘතික බැමි කිහිපයක්ම හඳුනාගත හැක.

ඒ අතුරින් ප්‍රධාන වශයෙන්ම කාන්තාවටම ආවේණික වූ සාම්ප්‍රදායික වෘත්තීය කිහිපයකට කාන්තාව සීමා කර කොටු කර පැවතීම, ව්‍යවසායකත්වය කෙරෙහි කාන්තාව තුළ පවතින ඍණාත්මක ආකල්ප, පුරුෂ මූලික සමාජ ක්‍රමයේ බලපෑම්, ව්‍යවසායිකාවක් ලෙස නැගී සිටීමේදී ඇගේ පවුල් පසුබිමෙන් එල්ල වන බාධා, ව්‍යාපාරික කටයුතු සමග පවුල් සමබරව පවත්වාගෙන යාමේ දුෂ්කරතා, බොහෝ කාන්තාවන්ට නූතන තාක්ෂණික දැනුම මදවීම, මූල්‍ය පහසුකම් ලබාගැනීමේදී ඇය මුහුණදෙන ලිංගභේද ගැටලු, සාමාජීය හා සංස්කෘතික ඍණාත්මක බලපෑම්, රාජ්‍ය හා අනෙකුත් වගකිව යුතු අංශයන්ගෙන් ලැබෙන මග පෙන්වීම අවම වීම ආදී නොයෙකුත් ගැටලු මේ අතර වේ.

මෙවැනි බාධක හමුවේ තමන්ගේම ව්‍යාපාරයක් කිරීමට කැමැත්තක් පැවතියද ඒ සඳහා බියකින් පසුවන කාන්තාවන්, කැමැත්තක් පැවතියද ව්‍යාපාර ආරම්භ කිරීමට අවස්ථාවක් හෝ හැකියාවක් නොමැතිකමෙන් පෙළෙන කාන්තාවන්, ව්‍යාපාර කටයුතු ආරම්භ කර එහි අතරමැද ප්‍රශ්න ගැටලුවලට මුහුණදී සිටින කාන්තාවන්, බාධක ජයගත නොහැකිව ව්‍යාපාරය අතරමග නතර කර දමා ඇති කාන්තාවන් අද නූතන සමාජය තුළ නිරීක්ෂණය කළ හැකිය.

නමුත් මෙහිදී වඩාත් අගය කළයුතු සතුටු විය හැකි කාරණය වනුයේ මේ සා විශාල ගැටලු බාධක මධ්‍යයේ වූවද ඉතිහාසය වෙනස් කළ, වෙනස් කරමින් සිටින්නා වූ කාන්තාවන් රාශියකගේ කලඑළි බැසීම වර්තමානය වනවිට දැක ගැනීමට හැකි වීමයි.

සාම්ප්‍රදායික ව්‍යාපාරික අදහස්වලින් බැහැරට ගොස් නව තාක්ෂණික පෙරළියක් ඔස්සේ නවෝත්පාදන හඳුන්වාදෙමින්, අවදානම් දරමින් එකී කාන්තා ව්‍යවසායකයා ශ්‍රී ලංකාවෙන් ඔබ්බට සයුර තරණය කර ජාත්‍යන්තර වෙළෙඳ පොළට පිවිසී තිබේ.

එවැනි කාන්තාවන් සවිබල ගැන්වීම ප්‍රධාන අරමුණු කරගෙන රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන පෞද්ගලික ආයතන ජාලයක් වර්තමානය වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී. එහි පතාක යෝධයන් ලෙස වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, Women's Chamber of Industry and Commerce (WCIC), කුඩා ව්‍යාපාර සංවර්ධන ආයතනය (SED), කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබාදෙන බැංකු හා මූල්‍ය ආයතන ඇතුළු මූල්‍ය පද්ධතිය, ව්‍යාපාර සංවර්ධන සේවා පහසුකම් සපයන ආයතන, ලක්සල ආදිය දැක්විය හැකිය.

මේ අයුරින් බලන කල ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කාන්තා ව්‍යවසායකයාගේ භූමිකාව තවදුරටත් ඔජනැං වීම උදෙසා වන වගකීම රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ කරමතද පැටවී තිබෙන බව පැහැදිලිය.

නිසි බලධාරීන්ගේ ඇස් මේ වෙත යොමු විය යුතුය. කාන්තා පාර්ශ්වය තව දුරටත් මුළුගැන්වී නොසිට ව්‍යාපාරික ලොවට කලඑළි බැසිය යුතුය. රාජ්‍ය රාජ්‍ය නොවන පෞද්ගලික ව්‍යාපාරික සේවා සපයන ආයතන ඔවුන්ගේ සාර්ථකත්වය කෙරෙහි උරදිය යුතුය.

මුළු මහත් සමාජයම ඔවුන් දෙස වපර ඇසින් බැලීම නවතා ඔවුන්ව තව දුරටත් අභිප්‍රේරණය කිරීමට දිරිමත් කිරීමට වැඩකටයුතු කළ යුතුය. එසේ නම් මේ කාලය එළැඹ ඇත්තේ දේශය ජීවත් කරවන ලක් මාතාවගේ ශ්‍රී නාමය මුළු ලොවටම ගෙන යන සියුමැලි කාන්තා දෑතට ශක්තියක් අත්වැලක් විය යුතු කාලයයි.

**චාතිනී ද සිල්වා,**
**ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය,**
**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

